# MAHAMEVNĀWA
## Buddhist Monastery – Toronto

නමෝ බුද්ධාය !

*මේ අපගේ ශ්‍රී ගෞතම බුද්ධ භාවනා ශාලාවයි*

# ආරාම පූජාවෙහි අනුසස්

*ඒ භාගයවත් වූ අරහත් වූ ගෞතම සම්මා සම්බුදුරජාණන් වහන්සේ උතුම් වූ ආරාම පූජාවෙහි ආනිශංස මේ අයුරින් දේශනා කොට වදාළ සේක.*

ආරාමයක් තුල වාසය කරන විට සීතල හේතුවෙන් ඇතිවෙන උවදුරු දුරු වේ. උෂ්ණය හේතුවෙන් ඇතිවෙන උවදුරු දුරු වේ. එමෙන් ම නපුරු සතුන්ගෙන් ද, සර්පයින්ගෙන් ද, මැසි මදුරුවන්ගෙන් ද ආරක්‍ෂා වේ.
ඊට අමතරව නපුරු රත්වූ සැඩ සුළං ආදියෙන්ද ආරක්‍ෂා වේ. හුදෙකලාවේ වාසය කිරීමට ද, පහසුවෙන් වාසය කිරීමට ද,සමථ විදර්ශනා භාවනා ආදිය පුරුදු කිරීමට ද, ආරාමය භික්ෂූන් වහන්සේලාට බොහෝ උපකාර වේ.
සංඝයා වහන්සේලා උදෙසා විහාර කරවීම බුදු රජුන් වර්ණනා කල සේක. අන්න ඒ නිසා තමාගේ යහපත කැමති සත්පුරුෂ කෙනා ධර්මය හොඳින් දන්නා ස්වාමීන් වහන්සේලාට වැඩ වාසය කිරීමට විහාර ඉදිකරනවා. ඉන්පසු ඒ සත්පුරුෂ කෙනා නිවන් මග පුරුදු කරන ඒ ස්වාමීන් වහන්සේලාට ආහාරපාන, සිවුරු පිරිකර ආදිය පුදමින් පැහැදුනු සිතින් උපස්ථාන කරනවා.
ඒ ස්වාමීන් වහන්සේලා ඔහුට සියලූ අකුසල් දුරු කොට මේ ජීවිතයේ ම සියලූ දුක් අවසන් කොට පිරිනිවන් පාන්නට හේතු වෙන උතුම් ශ්‍රී සද්ධර්මය දේශනා කරනවා.

(විනය පිටකයේ චුල්ල වග්ග පාළියේ සේනාසනක්ඛන්ධය ඇසුරෙනි)